සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/08/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ........................
දිනය / திகதி / Date: 2024.05.20

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන් වෙත,**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකාවන් (කාන්තාවන්) සඳහා හඳුන්වාදෙන "ලිය සවිය" ණය යෝජනා ක්‍රමය පෙර පාසල් ගුරුවරුන් සඳහා හඳුන්වාදීම.</u>**

"ලිය සවිය" ණය වැඩසටහන යටතේ කාන්තාවන් සඳහා විවිධ වූ සුළු ව්‍යාපාර, ස්වයං රැකියාවල නිරත වන හා ඒ සඳහා අවශ්‍ය වන්නා වූ මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙතින් ලබාදීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16 (නව) ට හතරවන එකතුව මගින් උපදෙස් ලබාදී ඇත.

2. මෙම ණය වැඩසටහන යටතේ ණය ලබාගැනීම සඳහා අවස්ථාවක් ලබාදෙන ලෙස පෙර පාසල් ගුරුවරුන්ගේ ජාතික සම්මේලනය මගින් ඉල්ලීම් කර ඇති අතර ඒ සඳහා අප විසින් එකඟතාවය පළකර ඇත.

3. ඒ අනුව "ලිය සවිය" ණය වැඩසටහන යටතේ පෙර පාසල් ගුරුවරුන් සඳහා ද ණය ලබාදීමට හැකි බව දන්වමි.

4. එමෙන්ම මේ වන විටත් සමෘද්ධි බැංකුවේ සාමාජික ලබාගෙන සුදුසුකම් සම්පූර්ණ කර ඇති පෙර පාසල් ගුරුවරුන් සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ උපරිම ණය මුදල ද අළුතින් සමෘද්ධි බැංකු සාමාජිත්වය ලබාගන්නා ගුරුවරුන්ට ආරම්භක ණය මුදල ද ලබාදිය හැකිය.

5. මෙම ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල අනිකුත් උපදෙස් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16 (නව) සහ ඊට අදාල එකතුන් හි සඳහන් උපදෙස් තවදුරටත් නොවෙනස්ව පවතී.

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස.හා අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
7. සමෘද්ධි මහා සංගමය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය - කා.දැ.ගැ.ස.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramu

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 288** |